# ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය

පුත්තලම් පාර, අනුරාධපුර

# අතුරු ව්‍යවස්ථාව

1996 අංක 26 දරන බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාල පනත

1996 අංක 26 දරන බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාල පනතේ 61(1)ඌ වගන්තිය සමග කියවිය යුතු 4 (ච) වගන්තිය යටතේ ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථාව

1996 අංක 26 දරන බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාල පනතේ 61(1)උ) වගන්තිය සමග කියවිය යුතු 4 (ච) වගන්තිය යටතේ ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් සකස් කරන ලද අතුරු ව්‍යවස්ථාව

**අතුරු ව්‍යවස්ථාව**

**<u>I වන කොටස - සාමාන්‍ය</u>**

| | |
|---|---|
| 01 | මෙම අතුරු ව්‍යවස්ථාව ''ශිෂ්‍ය විනය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව - 2023 අංක 04'' ලෙස හඳුන්වනු ලබන අතර එය 2023 මැයි 01 දින සිට ක්‍රියාත්මක වේ. මෙම අතුරු ව්‍යවස්ථාව මීට පෙර ශිෂ්‍යයන් වෙත නිකුත් කර ඇති ශිෂ්‍ය විනය හා සම්බන්ධ වෙනත් සියලු අතුරු ව්‍යවස්ථා හෝ රෙගුලාසි අභිබවා යනු ලබයි. |
| 02 | මෙම අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට පෙර ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය විසින් හෝ ඊට එරෙහිව (මෙහි මින් මතුවට විශ්වවිද්‍යාලය ලෙස සඳහන් කරනු ලබන) ඕනෑ ම අධිකරණයක හෝ විනිශ්චය සභාවක ආරම්භ කර ඇති හෝ ස්ථාපිත කර ඇති සියලු ම අභ්‍යන්තර විනය ක්‍රියාමාර්ග, නඩු, නඩු පැවරීම්, අභියාචනා හෝ වෙනත් සිවිල් හෝ සාපරාධි නීති ක්‍රියාමාර්ග සඳහා මීට පෙර නිකුත් කර ඇති අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන අදාළ වේ. |
| 03 | 1996 අංක 26 දරන විශ්වවිද්‍යාල පනතින් (මෙහි මින් මතුවට විශ්වවිද්‍යාල පනත ලෙස සඳහන් කරනු ලබන) හෝ වෙනයම් සාධන පත්‍රයකින් පාලක සභාව වෙත පවරා ඇති හෝ පනවා ඇති බලතල යුතුකම් සහ කාර්යයන් පිළිබඳ අගතියකින් තොරව මෙම අතුරු ව්‍යවස්ථා පරිපාලනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පාලක සභාව වගකිව යුතු වන්නේ ය. |
| 04 | මෙම අතුරු ව්‍යවස්ථාවල කිසිදු විධි විධානයකට පටහැණි වුවද විශ්වවිද්‍යාලයේ විනය පවත්වාගෙන යාම සඳහා මහෝපාධ්‍යායයන් වහන්සේ විසින් අවශ්‍ය යැයි සලකනු ලබන කවර හෝ උචිත පියවරක් ගැනීම කළ හැකි අතර, විශ්වවිද්‍යාල පනතින් හෝ වෙනත් යම් සාධන පත්‍රයකින් මහෝපාධ්‍යායයන් වහන්සේ වෙත පවරන ලද හෝ නියම කරන ලද බලතල, යුතුකම් සහ කාර්යයන් මෙම අතුරු ව්‍යවස්ථා මගින් කිසිදු ආකාරයකින් හීන කරවන ලෙසට තේරුම් නොගත යුතු ය. |
| 05 | මෙම අතුරු ව්‍යවස්ථා විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි සෑම ශිෂ්‍යයෙකුට ම (මෙහි මින් මතුවට 'ශිෂ්‍යයා' වශයෙන් සඳහන් කරනු ලබන) අදාළ වේ. |
| 06 | ඔවුන්ගේ යහපත් හැසිරීම සහ දැඩි විනය පිළිපැදීමට යටත්ව ශිෂ්‍යයින් විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂකයින් ලෙස ඇතුළත් කර ලියාපදිංචි කරනු ලැබේ. |
| 07 | මෙම අතුරු ව්‍යවස්ථාව සියලුම ශිෂ්‍යයන්ගේ දැන ගැනීම සඳහා විශ්වවිද්‍යාලයේ වෙබ් අඩවියේ ප්‍රදර්ශනය කළ යුතු වේ. තව ද, විද්‍යුත් ක්‍රමවේද භාවිත කරමින් ශිෂ්‍යයන් වෙත එය සමීප කිරීම සිදු කළයුතු අතර, විශ්වවිද්‍යාලයට ඇතුළත් වීම සඳහා ශිෂ්‍යයා විසින් විශ්වවිද්‍යාලය වෙත |

| | |
|---|---|
| | බාරදෙන ලද විශ්වවිද්‍යාල ප්‍රවේශ අයදුම්පත්‍රයෙහි ඇමුණුම් අංක 04 ට අනුගතව ශිෂයයා කටයුතු කළයුතුය. අදාළ ශිෂ්‍යයා විසින් කරන ලද එම ප්‍රකාශයට අනුකූලව එහි අතුරු ව්‍යවස්ථාවල විධිවිධානයන්ට ද බැඳී සිටිය යුතු වේ. |
| 08 | මෙම අතුරු ව්‍යවස්ථා ක්‍රියාත්මකවීමත්, සමගම එක් එක් ශිෂ්‍යයා වෙත උපාධි, ඩිප්ලෝමා, සහතික පත්‍ර හෝ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා පිරිනැමීම සඳහා (එම ශිෂ්‍යයන්ගේ සුදුසුකම් තීරණය කිරීමෙහිලා) එම ශිෂ්‍යයන්ගේ ක්‍රියා කළාපය සලකා බැලීමේ හා ඇගයීමේ පූර්ණ බලතල හා අධිකාරිය විශ්වවිද්‍යාලය සතු වන්නේ ය. |
| 09 | විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයෙකු වශයෙන් ලියාපදිංචි වීම සඳහා නියමිත පෝරමයේ අයදුම්පත ඊට අදාළ අවශ්‍යතාව පරිදි අනෙකුත් ලේඛන ද සමග ලැබීමෙන් පසු ලේඛකාධිකාරී විසින් හෝ මේ කාර්යය සඳහා ඔහු විසින් නම් කරනු ලැබිය හැකි වෙනත් යම් නිලධාරියෙකු විසින් ඒ ශිෂ්‍යයා ලියාපදිංචි කොට විශ්වවිද්‍යාලයේ මුද්‍රාව නිසි පරිදි බහාලූ අදාළ ශිෂ්‍යාගේ ඡායාරූපය සහිත හැඳුනුම්පතක් හා ශිෂ්‍ය වාර්තා පොතක් එසේ ලියාපදිංචි කළ ශිෂ්‍යයා වෙත නිකුත් කළ යුතු ය. |
| 10 | හැඳුනුම්පත හා ශිෂ්‍ය වාර්තා පොත ශිෂ්‍යයාගේ අනන්‍යතාව හා එහි සඳහන් විස්තරවල නිරවද්‍යතාව සම්බන්ධයෙන් අවසාන හා තීරණාත්මක සාක්ෂියක් වේ. (හැඳුනුම්පතේ හා ශිෂ්‍ය වාර්තා පොතේ සඳහන් විස්තර, ශිෂ්‍යයාගේ තත්ත්වය පිළිබඳ මූලික සාක්ෂි අඩංගු ලේඛන ලෙස සලකනු ලැබේ.) |
| **2 වන කොටස** | |
| **ශිෂ්‍යයෙකුගේ වගකීම්, යුතුකම් සහ විෂමාචාර ක්‍රියා** | |
| **වගකීම් සහ යුතුකම්:** | |
| 11 | විශ්වවිද්‍යාලයේ සෑම ශිෂ්‍යයෙකු සන්තකයෙහි ම, හැඳුනුම්පතක් හෝ ශිෂ්‍ය වාර්තා පොතක් තිබිය යුතු අතර එම හැඳුනුම්පත හෝ ශිෂ්‍ය වාර්තා පොත විනයපාලක, පීඨාධිපති, ශාලාධිපති, උපශාලාධිපති, අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයෙකු, ශිෂ්‍ය උපදේශකවරුන් හෝ මේ සඳහා මහෝපාධ්‍යායයන් වහන්සේ විසින් බලය පැවරූ නිලධාරියෙකු/පුද්ගලයෙකු විසින් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටි විට ශිෂ්‍යයා විසින් එය ලබා දිය යුතු වේ. |
| 12 | විශ්වවිද්‍යාලයේ සෑම ශිෂ්‍යයෙකු ම විනය ගරුක හැසිරීමකින් යුක්ත විය යුතු අතර ඔහු සැමවිටම උපාධි අපේක්ෂකයෙකුගේ, උපාධිධාරියෙකුගේ තත්ත්වයට සරිලන පරිදි විධිමත් ලෙස හැසිරිය යුතුය. |
| 13 | විශ්වවිද්‍යාල ශිෂ්‍යයින් සැමවිටම විශ්වවිද්‍යාලයේ ගෞරවය, කීර්ති නාමය ආරක්ෂා කිරීමට යත්න දැරිය යුතුය. |
| 14 | විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි වූ සෑම ශිෂ්‍යයෙකුම එහි දේපළ ආරක්ෂා කිරීමට හා රැකබලා ගැනීමට බැඳී සිටිය යුතුය. |
| 15 | සෑම ශිෂ්‍යයෙකු විසින් ම සෑම විට ම අනෙකුත් සහෝදර සිසුන්ගේ නිදහසට, ස්වාධීනත්වයට හා පෞද්ගලිකත්වයට ගරු කළ යුතු ය. |

| | | |
|---|---|---|
| 16 | සියලු ශිෂ්‍යයන් විශ්වවිද්‍යාලය සැහීමකට පත් වන ආකාරයෙන් ස්වකීය අධ්‍යයන කටයුතු හා බාහිර ඇවතුම් - පැවතුම් පවත්වා ගතයුතුය. | |
| **විෂමාචාර ක්‍රියාඃ** | | |
| 17 | පහත i සිට xix ඡේදවල දක්වා ඇති ඕනෑම ආකාරයකින් කටයුතු කරන ඕනෑ ම ශිෂ්‍යයෙකු විෂමාචාර ක්‍රියාවක් කර ඇති බවට සලකනු ලබන අතර මෙම අතුරු ව්‍යවස්ථාවල හෝ වෙනත් සාධන පත්‍රයක විධිවිධානවලට අනුකූලව දඬුවම් ලැබීමට යටත් වේ. | |
| | i. | ඉහත 11 වගන්තිය යටතේ නියම කර ඇති පරිදි ඕනෑ ම නිලධාරියෙකු විසින් ශිෂ්‍ය හැඳුනුම්පත හෝ ශිෂ්‍ය වාර්තා පොත ඉදිරිපත් කරන ලෙස දන්වා සිටි අවස්ථාවක එය ඉදිරිපත් කිරීමට අසමත්වීම, හිතාමතා ප්‍රතික්ෂේප කිරීම හෝ නොසලකා හැරීම. |
| | ii. | මෙම විශ්වවිද්‍යාලය නේවාසික භික්ෂු විශ්වවිද්‍යාලයක් බැවින් ගිහි ඇඳුමින් සැරසී ආයතනය තුළ හෝ පිටත හැසිරීම. මත්පැන් මත්ද්‍රව්‍ය භාවිතය. (ඒ බව සාක්ෂි සහිතව ඔප්පු වුවහොත් එය බරපතල විෂමාචාරයක් වන බැවින් ඒ නිසාම ශිෂ්‍ය භාවය අහෝසි වේ.) |
| | iii. | විධිමත් පරිදි ලබාගත් අවසරයකින් තොරව හෝ සාධාරණ හේතු රහිතව කිසියම් ශිෂ්‍යයෙකු අධ්‍යයන සමාසිකයක් තුළ සති 01 කට වැඩි කාලයක් දේශන හා ප්‍රායෝගික පංතිවලට සහභාගිවීමෙන් වැළකී සිටීම. |
| | iv. | විශ්වවිද්‍යාල කීර්ති නාමයට අහිතකර වන පරිදි අධ්‍යාපන කටයුතුවල යෙදීමෙන් හෝ විශ්වවිද්‍යාලයේ නීත්‍යානුකූල ක්‍රියාකාරීත්වයට බාධාවන අයුරින් කටයුතු කිරීමෙන් හෝ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරියෙකුට හෝ සේවකයෙකුට ඔහුගේ රාජකාරි කටයුතුවල යෙදීමට අවහිර වන, බාධාවන වන, අපහාසයක් වන අයුරින් හෝ නින්දාවක් වන අයුරින් ක්‍රියා කිරීම. |
| | v. | කිසියම් ශිෂ්‍යයෙකු විසින් වෙනත් ශිෂ්‍යයෙකුට විශ්වවිද්‍යාලය තුළ දී රටේ පවත්නා නීතිය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් හෝ ක්‍රියාවක් සිදුකිරීම, එවැන්නකට පෙළඹවීම හෝ මෙහෙයවීම හෝ ආධාර අනුබලදීම හෝ මෙම අතුරු ව්‍යවස්ථාවන්ගෙන් හෝ වෙනත් සාධන පත්‍රයකින් නිශ්චිතව දක්වා ඇති යම් ක්‍රියාවක් හෝ වැඩි ප්‍රමාණයක් සිදුකිරීමට පෙළඹවීම, මෙහෙයවීම හෝ ආධාර අනුබලදීම. |
| | vi. | කිසියම් ශිෂ්‍යයෙකු විශ්වවිද්‍යාලයේ බල මණ්ඩලවලට එහි සාමාජිකයන්ට, විශ්වවිද්‍යාල ප්‍රජාවේ සාමාජිකයෙකුට හෝ විශ්වවිද්‍යාල පරිශ්‍රයේ සිටින වෙනත් පුද්ගලයෙකුට හෝ අවඥා කිරීම, සමච්චල් කිරීම, පීඩාවට පත්කිරීම හෝ හිරිහැර කිරීම හෝ විශ්වවිද්‍යාලය අපකීර්තියට පත්කරන ඕනෑ ම ක්‍රියාවක නිරතවීම. |
| | vii. | 1998 අංක 20 දරන අධ්‍යාපන ආයතනවල නවක වදය හා වෙනත් ආකාරයේ සාහසික ක්‍රියාවන් වැළැක්වීමේ පනතේ විධිවිධානවලට පටහැණිව කිසියම් ශිෂ්‍යයෙකුට හෝ පුද්ගලයෙකුට විශ්වවිද්‍යාලය තුළ දී හෝ ඉන් පිටතදී කායික හෝ මානසික පීඩා ගෙන දෙන නවක වදය හෝ වෙනත් කවරාකාරයේ ක්‍රියාවක නිරත වීම. |

| | | |
|---|---|---|
| | viii. | විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හා පරිපාලන කටයුතු/ක්‍රියාපටිපාටි කඩාකප්පල් කිරීමට හේතු විය හැකි ඕනෑ ම ක්‍රියාවක නිරතවීම. |
| | ix. | විශ්වවිද්‍යාල ප්‍රජාවගේ සාමග්‍රියට හානිවන මෙන් ම පෞද්ගලික ජීවිතයට හිතකර නොවන ක්‍රියාවන්හි නිරත වීම. |
| | x. | විශ්වවිද්‍යාලයේ දේපලවලට හානි කිරීම හා/හෝ විනාශ කිරීම, එසේ හානි කිරීමට හා/හෝ විනාශ කිරීමට යත්න දැරීම. |
| | xi. | විශ්වවිද්‍යාල බලධාරීන් විසින් වරින් වර නිකුත් කරනු ලබන අතුරු ව්‍යවස්ථා, රෙගුලාසි, රීති, ප්‍රතිපත්ති, චක්‍රලේඛ, නියෝග හා/හෝ මාර්ගෝපදේශවලට අනුගතව කටයුතු නොකිරීම. |
| | xii. | විශ්වවිද්‍යාලය විසින් අනුමත කරන ලද ශිෂ්‍ය සංගම් හැර වෙනත් කිසිම සංවිධානයක්, සමිතියක්, සමාජයක්, විශ්වවිද්‍යාලය ඇතුළත ආරම්භ කිරීම, සංවිධානය කිරීම, පවත්වාගෙන යාම හා එවැනි කටයුතුවලට සහභාගිවීම හෝ එවැනි සංවිධාන වැඩවලට ආධාර දීම හෝ අනුබල දීම. |
| | xiii. | කිසියම් ශිෂ්‍යයෙකු/ශිෂ්‍යයන්, විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය සංගමයක් හෝ සංවිධානයක් හෝ වෙනත් ශිෂ්‍ය සංගමයක් හෝ මගින් විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ කිසියම් රැස්වීමක් කැඳවීම ප්‍රසිද්ධ රැස්වීමක් පැවැත්වීමට කටයුතු සැලැස්වීම හෝ රැස්වීමක් පැවැත්වීම හෝ ඊට සමාන වෙනයම් කටයුත්තක් පහත සඳහන් තත්ත්වයන් යටතේ සිදුකිරීම.<br><br>අ) නිශ්චිත බලධාරියාගේ පූර්ව ලිඛිත අනුමැතියකින් තොරවීම.<br>ආ) යම් රැස්වීමක් පවත්වන ස්ථානය, දිනය සහ ඒ සඳහා ගතවන කාල පරිච්ඡේදයට අදාළ නියමයන් හා කොන්දේසිවලට සහ ඒ ඒ තත්ත්වයන්ට අනුව නිශ්චිත බලධාරියා විසින් අවශ්‍යයැයි සලකා අනුමත කරන ලද නියමයන් සහ කොන්දේසි සමග අනුකූල නොවීම. |
| | xiv. | විශ්වවිද්‍යාලය තුළදී වෙනත් ශිෂ්‍යයෙකුට හෝ වෙනයම් පුද්ගලයෙකුට අයත් දේපළක් හෝ විශ්වවිද්‍යාලයට අයත් දේපළක් සොරාගැනීම. |
| | xv | විශ්වවිද්‍යාලයේ කීර්ති නාමයට අහිතකර හෝ අගතිගාමී විය හැකි ආකාරයෙන් හෝ විශ්වවිද්‍යාල පනතට හෝ වෙනයම් සාධන පත්‍රයකට පටහැණිව යම් ක්‍රියාවක නිරතවීම. |
| | xvi | මහෝපාධ්‍යායයන් වහන්සේගේ පූර්ව ලිඛිත අවසරය ලබා නොගෙන ශිෂ්‍යයෙකු/ශිෂ්‍යයන් හෝ යම් සමිතියක, සමාජයක, සංගමයක නිලතල දරන්නෙකු හෝ විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන්ගෙන්, කාර්ය මණ්ඩලයයෙන් හෝ පොදු ජනතාවගෙන් සම්මාදම් හෝ මුදල් කිසිවක් එකතු කිරීම හා/හෝ ඉල්ලා සිටීම.<br>(එසේ වුවද පනතේ 15(2) xii වගන්තියට අනුව සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවකට අනුව හෝ ලියාපදිංචි සමිතියක, සමාජයක හෝ සංගමයක ව්‍යවස්ථාවලට අනුකූලව එකතු කරනු ලබන සම්මාදමක් සම්බන්ධයෙන් මෙම වගන්තියේ විධිවිධාන අදාළ නොවන්නේ ය.) |

| | | |
|---|---|---|
| | xvii | විශ්වවිද්‍යාලයේ කීර්ති නාමයට හා විනයට හානිකරවන වචන, දැන්වීම් පත්‍රිකා, ප්‍රකාශන ආදිය මුද්‍රිත හා විද්‍යුත් ක්‍රම මගින් ප්‍රකාශයට පත්කිරීම හා/හෝ බෙදාහැරීම, සංසරණය කිරීම, ප්‍රදර්ශනය කිරීම,<br>විශ්වවිද්‍යාල පරිශ්‍රයේ හෝ භූමි පරිශ්‍රයේ සිටින විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය හෝ ශිෂ්‍යයින් අපහාසයට ලක්කිරීම.<br><br>කෙසේ වෙතත් මෙම ඡේදයේ විධිවිධාන පහත දැක්වෙන අවස්ථාවන්ට අදාළ නොවන්නේය.<br>අ) පනතේ 15(2) xii වගන්තිය යටතේ පිහිටුවා පිළිගනු ලැබුවාවූද හුදෙක්ම ශිෂ්‍ය සුභසිද්ධිය දියුණු කර ගැනීමට අදහස් කරනු ලැබුවාවූද යම් ශිෂ්‍ය සමිතියක, සමාජයක හෝ සංගමයක කටයුතුවලට අදාළ දැන්වීම්, විස්තර පත්‍රිකා, ප්‍රකාශන හා මුද්‍රිත ද්‍රව්‍ය.<br>ආ) විශ්වවිද්‍යාලයේ කීර්ති නාමයට හා විනයට හෝ විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයේ සාමාජිකයෙකුට හෝ ශිෂ්‍යයෙකුට හිතකර වන එවැනි ද්‍රව්‍ය. |
| | xviii | ඉහත xvii ඡේදයේ සඳහන් කර ඇති පරිදි, පත්‍රිකා ප්‍රකාශන, විද්‍යුත් හා මුද්‍රිත ද්‍රව්‍ය අදාළ ශිෂ්‍ය සංගමයේ, සමිතියේ හෝ වෙනත් සංගමයක සභාපතිගේ හෝ ලේකම්ගේ අත්සනින් තොරව මුද්‍රණය කිරීම. |
| | xix. | වෙනත් අතුරු ව්‍යවස්ථා, රීති, රෙගුලාසි. ආඥා පනත් ප්‍රතිපත්ති සහ විශ්වවිද්‍යාලයට අදාළ වන වෙනත් සාධන ලියවිලි සමග අනුකූල නොවීම හෝ ඒවා නොසලකා හැරීම. |

**3 වන කොටස**

**ශිෂ්‍ය විනය පිළිබඳ විනය මණ්ඩලයේ, මහෝපාධ්‍යායයන් වහන්සේගේ, විනය පාලකවරයාගේ, පීඨාධිපතිවරයාගේ, ශාලාධිපතිගේ බලතල**

**විනය මණ්ඩලය**

| | |
|---|---|
| 18 | මෙම අතුරු ව්‍යවස්ථා ක්‍රියාත්මක වීමත් සමග එහි 19 වන ඡේදයේ දක්වා ඇති පරිදි විනය මණ්ඩලයක් (මෙහි මින් මතුවට විනය මණ්ඩලය යනුවෙන් සඳහන් කරනු ලබන) පිහිටවනු ලැබේ. |
| 19 | විනය මණ්ඩලය පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත වියයුතු අතර, ඔවුන් පත්වීම් දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි වසරක (01) කාල පරිච්ඡේදයක් සඳහා ධුරය දරනු ඇත.<br><br>I එක් එක් පීඨයේ පීඨාධිපති<br>II විනය පාලක<br>III මහෝපාධ්‍යායයන් වහන්සේ විසින් නම් කරනු ලබන ශාලාධිපතිවරයෙකු<br>IV පත් කළ සාමාජිකයින් අතුරින් පාලක සභාව විසින් නම් කරනු ලබන සාමාජිකයෙකු<br>V මහෝපාධ්‍යායයන් වහන්සේ විසින් නම් කරනු ලබන ශිෂ්‍ය උපදේශකවරයෙකු<br>VI මහෝපාධ්‍යායයන් වහන්සේ විසින් නම් කරනු ලබන උපශාලාධිපතිවරයෙකු |

| | | |
|---|---|---|
| 20 | ලේඛකාධිකාරී හෝ ඔහු විසින් නම් කරනු ලබන තැනැත්තෙක් නිල බලයෙන් විනය මණ්ඩලයේ ලේකම්වරයා වන්නේය. | |
| 21 | විනය මණ්ඩලයේ සභාපතිවරයා, පීඨාධිපතිවරුන් අතුරෙන් සාමාජිකයින් විසින් තෝරා පත්කර ගනු ලබන අතර, ඔහු විනය මණ්ඩලයේ සියලු රැස්වීම්වල මුලසුන හොබවනු ඇත. යම් හෙයකින් රැස්වීමක මුලසුන දැරීමට සභාපතිවරයාට නොහැකි වන්නේ නම්, සාමාජිකයන් විසින් එවැනි රැස්වීමක මුලසුන දැරීමට වෙනත් පීඨාධිපතිවරයෙකු පත්කර ගත යුතු වේ. | |
| 22 | සභාපතිවරයා විනය මණ්ඩලයේ සභාපති වශයෙන් තෝරාපත් කර ගනු ලැබීමට සුදුස්සෙකු වූයේ යම් සාමාජික තත්ත්වයක් හේතුකොට ගෙන ද ඒ සාමාජික තත්ත්වය ඔහු දරන තාක්කල් පමණක් මෙහි සභාපති වේ. ඔහු තෝරාපත් කරගනු ලැබූ දින සිට ගණන් ගනු ලබන එක් වර්ෂයක කාලයක් සඳහා එම ධුරය දැරිය යුතු අතර, නැවත තෝරා ගනු ලැබීම සඳහා ඔහු සුදුසුකම් ඇත්තෙකි. ඔහු සභාපති ධුරයෙන් ඉල්ලා අස්වීමට අදහස් කරන්නේ නම් ඒ බව මහෝපාධ්‍යායයන් වහන්සේ වෙත ලිඛිතව දැන්විය යුතු අතර, ඉන් අනතුරුව මහෝපාධ්‍යායයන් වහන්සේ පීඨාධිපතිවරුන් අතරින් වෙනත් අයෙකු පත්කරන ලෙස විනය මණ්ඩලයට දන්වා සිටිනු ඇත. | |
| 23 | විනය මණ්ඩලයේ රැස්වීමක ගණපූරණය සාමාජිකයන් පස් දෙනෙකුගෙන් (5) සමන්විත විය යුතුය. | |
| 24 | විනය මණ්ඩලය අවම තරමින් මාස තුනකට වරක්වත් රැස්විය යුතුය. | |
| 25 | පනතේ විධිවිධානවලට සහ වෙනත් ඕනෑම සාධන පත්‍රයක විධිවිධානවලට යටත්ව විනය මණ්ඩලයට පහත සඳහන් බලතල, වගකීම් හා කාර්යයන් අයත් වන්නේ ය. | |
| | I | විශ්වවිද්‍යාලය තුළ ශිෂ්‍ය විනය පවත්වාගෙන යාම සම්බන්ධයෙන් සියලු කරුණු නියාමනය හා තීරණය කිරීම. |
| | II | විශ්වවිද්‍යාලය තුළ ශිෂ්‍ය විනය සම්බන්ධ රීති සම්පාදනය කිරීම. |
| | III | විමර්ශන කමිටුවේ වාර්තාව සමාලෝචනය කිරීම සහ මහෝපාධ්‍යායයන් වහන්සේට පහත සඳහන් කරුණුවලින් එකක් නිර්දේශ කිරීම. |
| | | අ. කිසියම් විනය විරෝධී හෝ විෂමාචාර ක්‍රියාවක් සම්බන්ධයෙන් වැරැදිකරුවෙකු වී ඇති හෝ යම් වරදකට වරදකරු වී ඇති හෝ මෙම අතුරු ව්‍යවස්ථාවල සහ විනය මණ්ඩලය විසින් සාදන ලද රීතිවලට පටහැණිව ක්‍රියා කරන ඕනෑ ම ශිෂ්‍යයෙකු හෝ ශිෂ්‍යයන් සම්බන්ධයෙන් සුදුසු දඬුවම් පැමිණවීම. |
| | | ආ. යම්කිසි කරුණක් සම්බන්ධයෙන් විනය මණ්ඩලයට තවදුරටත් පැහැදිලි කරගැනීමක් හෝ ඒ පිළිබඳව තවදුරටත් විමර්ශනය කර ගැනීමක් අවශ්‍ය නම් එම කරුණ නැවත විමර්ශන කමිටුව වෙත යොමු කළ හැකිය, නැතහොත් අවශ්‍ය පරිදි වැඩිදුර පරීක්ෂණ සඳහා යොමු කළ හැකිය. අවස්ථානුගතව තත්ත්වයන් යුක්ති සහගත වන්නේ නම්, ඕනෑම විමර්ශන ක්‍රියාවලියක් අවලංගු කිරීමට හා නව විමර්ශනයක් පවත්වන ලෙස මහෝපාධ්‍යායයන් වහන්සේගෙන් ඉල්ලා සිටීම. |

| | | |
|---|---|---|
| | iv | කිසියම් කරුණක් සම්බන්ධයෙන් විනය මණ්ඩලයට වැඩිදුර පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය නම් විනය මණ්ඩලයේ කටයුතු සඳහා ඕනෑ ම අයෙකුට ආරාධනා කිරීම. |
| | v | මෙම අතුරු ව්‍යවස්ථාවල අරමුණු තවදුරටත් ඉදිරියට ගෙනයෑම සඳහා අවශ්‍ය විය හැකි පරිදි මෙම අතුරු ව්‍යවස්ථාවල සඳහන් බලතලවලට අනියම් ලෙස අනෙකුත් සියලු ම කාර්යයන් කිරීම, හා |
| | vi | මෙම අතුරු ව්‍යවස්ථා උල්ලංඝනය කිරීමක් සම්බන්ධයෙන් හෝ මෙම අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදු කර ඇති අවස්ථාවක දී ලියාපදිංචි වූ ශිෂ්‍යයෙකුට පහත සඳහන් දඬුවම්වලින් එකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් පැනවීමට මහෝපාධ්‍යායයන් වහන්සේට නිර්දේශ කිරීමට විනය මණ්ඩලයට හැකියාව ඇත. |

| | |
|---|---|
| අ) | ලිඛිත අවවාදයක් හෝ දැඩි තරවටු කිරීමක්. |
| ආ) | නිශ්චිත කාල පරිච්ඡේදයක් සඳහා විශ්වවිද්‍යාලයට පැමිණීම අත්හිටුවීම. මේ වනවිටත් ශිෂ්‍යයෙකු, විනය ක්‍රියාමාර්ගයකට යටත්ව විශ්වවිද්‍යාලයට පැමිණීම අත්හිටුවීමකට ලක්කොට ඇත්නම්, එම කාල පරිච්ඡේදය ද දඬුවමේ කොටසක් ලෙස සැලකිය හැකිය. |
| ඇ) | ශිෂ්‍යයාගේ නේවාසික පහසුකම් ඉවත් කිරීම. |
| ඈ) | මහපොළ ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය හා වෙනත් ඕනෑම ශිෂ්‍යාධාර ක්‍රමයක් යටතේ වූ යම් ප්‍රතිලාභ ආධාර හෝ ප්‍රදාන ඉවත් කිරීම, අවලංගු කිරීම හෝ අත්හිටුවීම. |
| ඉ) | නිශ්චිත කාල පරිච්ඡේදයක් සඳහා විශ්වවිද්‍යාලයේ මොනයම් හෝ විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම. |
| ඊ) | නිශ්චිත කාල පරිච්ඡේදයක් සඳහා විශ්වවිද්‍යාල විභාගයක ප්‍රතිඵල නිකුත් කිරීම අත්හිටුවීම. |
| උ) | උපාධි ඩිප්ලෝමා, සහතික පත්‍ර හෝ වෙනත් අධ්‍යයන විශිෂ්ටතා ප්‍රදානය නොකර රඳවා ගැනීම /ඉවත් කිරීම. |
| ඌ) | විශ්වවිද්‍යාලයෙන් නෙරපා හැරීම. |

**<u>මහෝපාධ්‍යායයන් වහන්සේ</u>**

| | |
|---|---|
| 26 | මෙම අතුරු ව්‍යවස්ථාවල සඳහන් කිසිදු විධිවිධානයකට පටහැනිව හෝ කිසිවක් නොතකා, මහෝපාධ්‍යායයන් වහන්සේ විසින් විශ්වවිද්‍යාලයේ විනය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය යැයි සිතන සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. |
| 27 | විශ්වවිද්‍යාල සිසුන් අතර විනය පවත්වාගෙන යාමේ බලධාරියා මහෝපාධ්‍යායයන් වහන්සේ වේ. මහෝපාධ්‍යායයන් වහන්සේට එම බලතල (අ) විනය මණ්ඩලය (ආ) විනයපාලක (ඇ) පීඨාධිපති (ඈ) ශාලාධිපති මගින් ක්‍රියාත්මක කළ හැකිය. |
| 28 | මහෝපාධ්‍යායයන් වහන්සේට පැමිණිල්ලක් ලැබුණහොත් හෝ විනය උල්ලංඝනය කිරීමක් පිළිබඳව දැනුවත් වුවහොත් ඒ සම්බන්ධයෙන් පහත සඳහන් ක්‍රියාමාර්ග එකක් හෝ කිහිපයක් ගත හැකිය. |
| 29 | අදාළ සිද්ධිය සම්බන්ධයෙන් මූලික පරීක්ෂණයක් පවත්වා වාර්තාවක් ලබාදෙන ලෙසට විනය පාලකවරයාට උපදෙස් දීමට හැකිවේ. |

| | | |
|---|---|---|
| 30 | එවැනි මූලික විමර්ශනයක වාර්තාව අධ්‍යයනය කිරීමෙන් අනතුරුව පහත දැක්වෙන ක්‍රියාමාර්ගවලින් කවර හෝ පියවරක් ගැනීමට මහෝපාධ්‍යායයන් වහන්සේට හැකිවන්නේය. | |
| | අ | සිදු කරන ලද වරද බරපතල නොවන බව මහෝපාධ්‍යායයන් වහන්සේගේ අදහස වන්නේ නම්, සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීම සඳහා කාරණය විනය පාලකවරයා වෙත යොමු කළ හැකිය. |
| | ආ | සිදුකරන ලද වරද බරපතළයැයි මහෝපාධ්‍යායයන් වහන්සේගේ අදහස වන්නේ නම්, වහාම අදාළ ශිෂ්‍යයා/ශිෂ්‍යයන් වෙත චෝදනා පත්‍රයක් ඉදිරිපත් කිරීමට හැකිවේ. |
| | ඇ | අදාළ ශිෂ්‍යයා/ශිෂ්‍යයන් විසින් ඉදිරිපත් කරන ලද නිදහසට කරුණ/ කරුණු සම්බන්ධයෙන් මහෝපාධ්‍යායයන් වහන්සේ සෑහීමට පත්නොවන්නේ නම්, එම සිද්ධිය පිළිබඳව විමර්ශනය කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් තිදෙනෙකුගෙන් (3) සමන්විත විමර්ශන කමිටුවක් හෝ පාලක සභාව විසින් අනුමත කළ විමර්ශන නිලධාරියෙකු පත්කිරීමට හැකිය. |
| 31 | විමර්ශන කමිටුවේ වාර්තාව විනය මණ්ඩලය වෙත යොමු කිරීම. | |
| 32 | විනය මණ්ඩලයේ නිර්දේශ ලැබීමෙන් අනතුරුව එම නිර්දේශ ක්‍රියාත්මක කිරීමට මහෝපාධ්‍යායයන් වහන්සේට හැකි ය. | |
| 33 | අදාළ විනය උල්ලංඝනය කිරීම බරපතළ ස්වාභාවයක් දරන්නේ නම් හා ඊට සම්බන්ධ කිසියම් ශිෂ්‍යයෙකු විශ්වවිද්‍යාලය තුළ රැඳී සිටීම, ආරම්භ කිරීමට නියමිත විමර්ශන/විනය ක්‍රියාමාර්ගවලට අහිතකර බවට මහෝපාධ්‍යායයන් වහන්සේ සෑහිමකට පත්වන්නේ නම් හෝ විශ්වවිද්‍යාලයේ සුමට ක්‍රියාකාරීත්වයට හා සුහදශීලි වාතාවරණයට අහිතකර වන්නේ නම්, එම පරීක්ෂණ අවසන් වන තෙක් හෝ පරීක්ෂණයේ සොයාගැනීම් සම්බන්ධයෙන් අවසන් තීරණයකට එළඹෙන තෙක් තාවකාලිකව එම ශිෂ්‍යා/ශිෂ්‍යයන් විශ්වවිද්‍යාලයට පැමිණීම අත්හිටුවීමට මහෝපාධ්‍යායයන් වහන්සේට හැකිවේ. | |
| 34 | පනවන ලද දඬුවම් සම්බන්ධයෙන් අගතියට පත් වූ ශිෂ්‍යයා/ශිෂ්‍යයන් විසින් ඉදිරිපත් කරනු ලබන සියලු ම අභියාචනා ලැබීමෙන් පසුව මහෝපාධ්‍යායයන් වහන්සේ විසින් එම අභියාචනා අවසාන නිර්දේශයක් ලබාගැනීම සඳහා අභියාචනා මණ්ඩලයක් වෙත යොමු කළ යුතු වේ. | |
| 35 | මහෝපාධ්‍යායයන් වහන්සේ විසින්, ඔහුගේ මුල් තීරණය වෙනස් කරමින්, සංශෝධනය කරමින්, අවලංගු කරමින් හෝ තහවුරු කරමින් ලබාදෙන ලද අභියාචනා මණ්ඩලයේ නිර්දේශ සම්බන්ධ තීරණය අදාළ ශිෂ්‍යයාට ලබාදිය යුතු වේ. මහෝපාධ්‍යායයන් වහන්සේ විසින් ඔහු වෙත පැවරී ඇති බලතල යුතුකම් සහ කාර්යයන් ඉටු කිරීම ක්‍රියාත්මක කිරීම උදෙසා ගනු ලැබූ එවැනි තීරණ අවසාන හා තීරණාත්මක විය යුතුය. | |
| 36 | වරක් මහෝපාධ්‍යායයන් වහන්සේ විසින් සන්නිවේදනය කරන ලද අභියාචන මණ්ඩලයේ තීරණය අවසන් සහ තීරණාත්මක විය යුතුය. | |

| | |
|---|---|
| | **<u>විනය පාලක</u>** |
| 37 | විශ්වවිද්‍යාලයේ විනය පාලකවරයා ලෙස අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙකු පත්කිරීමට මහෝපාධ්‍යායයන් වහන්සේට හැකි අතර, ඔහු විශ්වවිද්‍යාලය තුළ ශිෂ්‍ය විනය සම්බන්ධ කටයුතුවල දී මහෝපාධ්‍යායයන් වහන්සේ වෙනුවෙන් කටයුතු කළ යුතු වන්නේ ය. |
| | **<u>විනය පාලක සතු බලතල</u>** |
| 38 | විශ්වවිද්‍යාල පනතේ හා විශ්වවිද්‍යාලයට අදාළ විය හැකි වෙනත් සාධන පත්‍රයක විධිවිධානවලට යටත්ව, විශ්වවිද්‍යාලයේ සිසුන් අතර විනය පවත්වාගෙන යාම භාරව කටයුතු කළ යුත්තේ විනය පාලක වේ. |
| 39 | විනය පාලකවරයා ඔහුගේ රාජකාරි ඉටුකිරීමේ දී මහෝපාධ්‍යායයන් වහන්සේගේ උපදෙස් පරිදි කටයුතු කළ යුතු වේ. |
| 40 | විශ්වවිද්‍යාලයේ විනය කඩ කිරීම් සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් විනය පාලක විසින් පවත්වා මහෝපාධ්‍යායයන් වහන්සේගේ උපදෙස් පරිදි සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වන්නේ ය. |
| 41 | විනය කඩකිරීම් පිළිබඳ සිද්ධිය පහත සඳහන් දඬුවම්වලින් එකක් පැනවීම මගින් ප්‍රමාණවත් ලෙස විසඳිය හැකි ස්වභාවයේ එකක් වන විට දී තමා විසින්ම ක්‍රියාමාර්ගයක් ගැනීම ඔහුට කළ හැකිය.<br>i සති හතරකට (04) නොඉක්මවන කාල පරිච්ඡේදයක් සඳහා විශ්වවිද්‍යාලයට පැමිණීම අත්හිටුවීම.<br>ii ලිඛිත අවවාද කිරීමක් |
| 42 | මෙම විධිවිධාන යටතේ විනය පාලකවරයා ක්‍රියාකරන සෑම අවස්ථාවකම ඒ සම්බන්ධයෙන් වාර්තාවක් මහෝපාධ්‍යායයන් වහන්සේගේ එකගතාව සඳහා ඉදිරිපත් කළ යුතු වන්නේ ය. |
| 43 | විනය පාලකවරයා විසින් පවත්වන ලද විමර්ශනයන්ගෙන් අනාවරණය වන සිද්ධීන් ඉහත සඳහන් දඬුවම් ලබාදීමෙන් විසඳිය හැකි නොවන බරපතළ ඒවා බවට හෙළි වුවහොත්, විනය පාලකවරයා විසින් මූලික විමර්ශනයක් පවත්වා මෙම අතුරු ව්‍යවස්ථා යටතේ උචිත ක්‍රියාමාර්ගයක් ගැනීම සඳහා ඔහුගේ සොයාගැනීම් සහ නිර්දේශ මහෝපාධ්‍යායයන් වහන්සේ වෙත ඉදිරිපත් කළ යුතු වේ. |
| 44 | විෂමාචාර ක්‍රියාවකට සම්බන්ධ වූ කිසියම් ශිෂ්‍යයෙකුට හෝ ශිෂ්‍යයන්ට විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ රැඳී සිටීමට අවසර දීමෙන් විශ්වවිද්‍යාලයේ සුමට ක්‍රියාකාරිත්වයට හෝ සුහදශීලී වාතාවරණයට හෝ විමර්ශන පැවැත්වීමට අහිතකර වනු ඇතැයි විනය පාලකවරයාගේ අදහස වන්නේ නම්, මූලික විමර්ශන හා/ හෝ විධිමත් පරීක්ෂණ පැවැත්වීමට යටත්ව මහෝපාධ්‍යායයන් වහන්සේගේ එකගතාව ඇතිව එම ශිෂ්‍යයා/ශිෂ්‍යයන් විශ්වවිද්‍යාල පරිශ්‍රයට පැමිණීම අත්හිටුවීමට විනය පාලකවරයාට හැකිය. මෙම විධිවිධාන යටතේ විනය පාලකවරයා ක්‍රියා කරන සෑම අවස්ථාවක ම ඔහු මහෝපාධ්‍යායයන් වහන්සේට වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | | **පීඨාධිපති** |
| 45 | පීඨය තුළ සියලු ම සිසුන්ගේ විනය පාලනය කිරීම සඳහා විශ්වවිද්‍යාලයේ එක් එක් පීඨයේ පීඨාධිපතිට පූර්ණ බලය හා අධිකාරිය ඇත්තේ ය. පීඨාධිපතිවරයාට පවරා ඇති බලතල අනුව එම පීඨයේ විනය පවත්වාගෙන යෑම සම්බන්ධයෙන් අවශ්‍යයැයි සිතන උපදෙස් කලින් කලට නිකුත් කළ හැකි වේ. | | |
| 46 | පීඨාධිපති විසින් සිය පීඨයේ ශිෂ්‍යයන් අතර විනය පැනවිය යුතු අතර, ඔහුගේ පීඨයේ ශිෂ්‍යයන්ගේ විනය සම්බන්ධ කරුණුවලදී විනය පාලකවරයා සමග සාකච්ඡා කර කටයුතු කළ හැකි වේ. | | |
| 47 | පීඨාධිපති විසින් විනය කඩකිරීම පිළිබඳව පැමිණිලිවලට අදාළව ලඝු හෝ මූලික විමර්ශනයක් පවත්වා විනය විරෝධි ක්‍රියාව ප්‍රමාණවත් ලෙස විසඳිය හැකි ස්වභාවයේ එකක් වන විටදී පහත සඳහන් දඬුවම් අතරින් එකක් පැනවීම මගින් ඔහු විසින් ම උචිත ක්‍රියාමාර්ගයක් ගත යුතුය. | | |
| | අ | සති දෙකක් නොඉක්මවන කාල පරිච්ඡේදයක් සඳහා අධ්‍යයන කටයුතු අත්හිටුවීම. | |
| | ආ | ලිඛිත අවවාද කිරීමක්. | |
| | | i | සියලුම ලිඛිත අවවාදයන් /දඬුවම්වල පිටපත් චෝදනා ලැබූ ශිෂ්‍යයාගේ පෞද්ගලික ලිපිගොනුවට යැවිය යුතුය. |
| | | ii | පීඨාධිපතිවරයෙකු ඉහත විධිවිධාන යටතේ ක්‍රියාමාර්ගයක් ගනු ලබන සෑම කරුණක් සම්බන්ධයෙන්ම ඔහු විසින් මහෝපාධ්‍යායයන් වහන්සේගේ එකගතාව සඳහා වාර්තාවක් විනය පාලකවරයාට ද පිටපතක් සහිතව ඉදිරිපත් කළයුතු වේ. |
| 48 | පීඨාධිපති විසින් පවත්වන ලද විමර්ශනයෙන් ඉහත සඳහන් දඬුවම් පැනවීමෙන් ප්‍රමාණවත් ලෙස විසඳිය නොහැකි ස්වභාවයේ බරපතල විනය කඩකිරීමේ සිද්ධීන් අනාවරණය වන විටදී මෙම අතුරු ව්‍යවස්ථා යටතේ උචිත ක්‍රියාමාර්ගයක් ගැනීම සඳහා එම කරුණ විනය පාලකවරයා වෙත ඉදිරිපත් කළ යුතු වේ. | | |
| 49 | විනය විරෝධි හැසිරීමකට සම්බන්ධ වූ යම් ශිෂ්‍යයෙක්/ශිෂ්‍යයන් විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ රැඳී සිටීම, පීඨයේ හෝ විශ්වවිද්‍යාලයේ සුමට ක්‍රියාකාරීත්වයට හා සුහදශීලී වාතාවරණයට අහිතකර වනු ඇතැයි පීඨාධිපතිවරයාගේ අදහස වන්නේ නම්, පීඨාධිපතිවරයා එම කාරණය සුදුසු පියවරක් ගැනීම සඳහා මහෝපාධ්‍යායයන් වහන්සේ වෙත වාර්තා කළ යුතුය. | | |
| | | | **ශාලාධිපති** |
| 50 | අදාළ නේවාසික ශාලාවේ උපශාලාධිපතිවරයාගේ සහාය ඇතිව නේවාසික ශාලාව තුළ සිටින සියලු ම සිසුන්ගේ විනය එම පරිශ්‍රය තුළ පවත්වාගෙන යාමේ වගකීම ශාලාධිපති සතු වේ. | | |
| 51 | නේවාසිකාගාරයක ශාලාධිපතිවරයෙකුගේ රාජකාරිය වනුයේ, | | |
| | i | නේවාසිකාගාරයේ ශිෂ්‍යයන් අතර විනය පවත්වා ගැනීම හා නේවාසිකාගාරයේ ශිෂ්‍ය විනයට අදාළ වන කරුණු සම්බන්ධයෙන් මහෝපාධ්‍යායයන් වහන්සේ , විනය පාලක, සමග සාකච්ඡා කොට ඒ පිළිබඳ කටයුතු කිරීම. | |

| | | |
|---|---|---|
| | ii | සිදුව ඇති විනය කඩකිරීම බරපතල තත්වයේ එකක් නොවන අවස්ථාවක දී ඒ පිළිබඳ ඔහු විසින්ම මූලික විමර්ශනයක් පවත්වා පහත සඳහන් දඬුවම් අතරින් එකක් පනවා උචිත ක්‍රියාමාර්ග ගැනීම.<br><br>ඇ) සති දෙකක් නොඉක්මවන කාල පරිච්ඡේදයක් සඳහා නේවාසිකාගාරයට පැමිණීම අත්හිටුවීම.<br>ආ) ලිඛිත අවවාද කිරීමක්. |
| | iii | ශාලාධිපතිවරයා විසින් ඉහත විධිවිධාන යටතේ කටයුතු කරන සෑම අවස්ථාවකම මහෝපාධ්‍යායයන් වහන්සේගේ එකගතාව සඳහා වාර්තාවක් විනය පාලකවරයාට ද පිටපත් සහිතව ඉදිරිපත් කළ යුතුය. |
| | iv | දඬුවම පැනවීමට අදාළ ලිපියේ පිටපතක් දඬුවම් ලැබූ ශිෂ්‍යයා/ශිෂ්‍යයන්ගේ භාරකාර ස්වාමින් වහන්සේට යැවීම හා පෞද්ගලික ලිපිගොනුවේ වාර්තා ගතකර තැබීම සඳහා එම ශිෂ්‍යයා/ශිෂ්‍යයන්ගේ පීඨයේ පීඨාධිපති/ පීඨාධිපතිවරු මගින් ශිෂ්‍ය සේවා අංශය වෙත යැවීම. |
| 52 | ශාලාධිපති විසින් පවත්වනු ලබන විමර්ශනයෙන් ඉහත සඳහන් දඬුවම් පැනවීම මගින් ප්‍රමාණවත් පරිදි විසඳාගත නොහැකි බරපතල විනය විරෝධී සිද්ධීන් අනාවරණය වන අවස්ථාවකදී, ශාලාධිපති විසින් එම කාරණය මූලික පරීක්ෂණයක් පැවැත්වීම සඳහා විනය පාලකවරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, ඔහුගේ සොයාගැනීම් සහ නිර්දේශ මෙම අතුරු ව්‍යවස්ථා යටතේ සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීම සඳහා මහෝපාධ්‍යායයන් වහන්සේ වෙත යොමුකළ යුතු වේ. | |
| 53 | විනය විරෝධී ක්‍රියාවක නිරත වූ කිසියම් ශිෂ්‍යයෙකු/ශිෂ්‍යයන්ට විශ්වවිද්‍යාලය තුළ රැඳී සිටීමට අවසරදීමෙන් නේවාසිකාගාරයේ හෝ විශ්වවිද්‍යාලයේ සුමට ක්‍රියාකාරිත්වයට හා සුහදශීලි වාතාවරණයට අහිතකර වනු ඇතැයි ශාලාධිපතිට හැඟී යන්නේ නම් උන්වහන්සේ එම කාරණය පිළිබඳ උචිත ක්‍රියාමාර්ගය ගැනීම සඳහා  මහෝපාධ්‍යායයන් වහන්සේ වෙත ඉදිරිපත් කළ යුතු වේ. | |
| **4 වන කොටස** | | |
| **විමර්ශන ක්‍රියාවලිය සහ අභියාචනා** | | |
| **මූලික විමර්ශන** | | |
| 54 | මෙම අතුරු ව්‍යවස්ථාවල 40 හා 43 ඡේද යටතේ විනය පාලකවරයා විසින් ද 47 ඡේදය යටතේ පීඨාධිපති විසින්ද 51(ii) ඡේදය යටතේ ශාලාධිපති විසින් ද මූලික විමර්ශනයක් පැවැත්විය යුතු ය. | |
| 55 | මූලික විමර්ශන ක්‍රියාවලියේදී එම වරදට මැදිහත් වූ චූදිත ශිෂ්‍යයා/ශිෂ්‍යයන්ගෙන් හා සාක්ෂිකරුවන්ගෙන් ඔවුන් කැමති භාෂාවකින් ප්‍රකාශයක්/ප්‍රකාශ සටහන් කරගත යුතු අතර අදාළ වෙනත් සාක්ෂි ද රැස්කරගත යුතු වන්නේ ය. | |

| | | |
|---|---|---|
| 56 | මූලික විමර්ශන හැකි සෑම අවස්ථාවකදී ම සති දෙකක කාලයක් තුළ අවසන් කළ යුතු ය. | |
| 57 | මූලික විමර්ශන වාර්තාව මහෝපාධ්‍යායයන් වහන්සේ වෙත ඉදිරිපත් කළ යුතු ය. | |
| | **විධිමත් පරීක්‍ෂණය** | |
| 58 | විධිමත් පරීක්ෂණයකට අවස්ථාව සලස්වමින් බරපතළ තත්ත්වයේ විනය විරෝධි සිද්ධීන් මූලික විමර්ශනයෙන් අනාවරණය වන්නේ නම්, අදාළ සැකකාර ශිෂ්‍යයා/ශිෂ්‍යයන්ට මෙම අතුරු ව්‍යවස්ථාවල 25(vi) ඡේදය යටතේ තමන්ට දඬුවම් පැමිණවීම නොකළ යුත්තේ යැයි සිතන්නේ නම් නිදහසට කරුණු නියම කරනු ලබන කාල සීමාව තුළ ලබාදෙන ලෙස සඳහන් කරමින් චෝදනා පත්‍රයක් හෝ චෝදනා පත්‍ර නිකුත් කළ යුතුය. | |
| 59 | අදාළ ශිෂ්‍යයා/ශිෂ්‍යයන් විසින් ඉදිරිපත් කරන ලද නිදහසට කරුණු සම්බන්ධයෙන් මහෝපාධ්‍යායයන් වහන්සේ සෑහිමට පත් නොවන්නේ නම් විධිමත් පරීක්‍ෂණයක් පැවැත්වීම සඳහා මෙම අතුරු ව්‍යවස්ථාවල 30(ඇ) ඡේදය යටතේ මහෝපාධ්‍යායයන් වහන්සේ විසින් පරීක්ෂණ කමිටුවක් පත්කළ යුතු වන්නේ ය. | |
| 60 | පරීක්ෂණ කමිටුව පත්කොට මාසයක කාලයක් තුළ විධිමත් පරීක්ෂණය ආරම්භ කළ යුතු අතර හැකි සෑමවිට ම මාස තුනක (3) කාලයක් තුළ එම පරීක්ෂණය අවසන් කළ යුතු ය. පරීක්ෂණ වාර්තාව මහෝපාධ්‍යායයන් වහන්සේ වෙත ඉදිරිපත් කළ යුතු ය. | |
| 61 | 1 | විශ්වවිද්‍යාලයේ කිසියම් ශිෂ්‍යයෙකු/ශිෂ්‍යයන් ඕනෑම පරීක්ෂණයක් සඳහා පැමිණවීමට හෝ එහි වාචික සාක්‍ෂි ලබාදීමට හා ලිඛිත ප්‍රකාශයක් ලබාදෙන ලෙසට යොමුකරවීමටත් ඔහුගේ පැවැත්ම/හැසිරීමට/හෝ වෙනයම් ශිෂ්‍යයෙකුගේ කරුණක් සම්බන්ධයෙන් ලිඛිත ප්‍රකාශයක් ලබාදීමට යොමුකරවීමටත් පරීක්ෂණ කමිටුවට බලය ඇත්තේ ය. එමෙන් ම පරීක්ෂණයක සාක්‍ෂි ලබාදීම සඳහා විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයේ කිසියම් සාමාජිකයෙකුගෙන් ඉල්ලා සිටීමටද පරීක්ෂණ කමිටුවට හැකිවේ. |
| | 2 | යුක්තියේ නීතිවලට අනුකූලව පරීක්ෂණ පැවැත්වීම පරීක්ෂණ කමිටුවේ වගකීම වේ. |
| | 3 | චූදිත ශිෂ්‍යයෙකු විධිමත් පරීක්ෂණයකට පෞද්ගලිකව සහභාගි විය යුතු අතර, මහෝපාධ්‍යායයන් වහන්සේගේ ලිඛිත අනුමැතිය යටතේ පමණක් ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයීය භික්ෂු ශිෂ්‍ය භික්ෂු සංගමයේ හෝ අදාළ පීඨ ශිෂ්‍ය සංගමයේ නියෝජිතයෙකු සමග පැමිණීමට අවසර ඇත. |
| | **අභියාචනා** | |
| 62 | දඬුවමක් නියම කරනු ලැබුවා වූද එම දඬුවම සම්බන්ධයෙන් අගතියට පත්වූ ඕනෑ ම ශිෂ්‍යයෙකුට එවැනි දඬුවමක් තමා වෙත දැනුම් දුන් දින සිට එක් මසක කාලයක් ඇතුළත ඒ දඬුවමට එරෙහිව මහෝපාධ්‍යායයන් වහන්සේ වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට අයිතියක් ඇත්තේ ය. (අදාළ මාසයක කාලයට එම දඬුවම දැනුම්දුන් දිනයන් හා අභියාචනය ඉදිරිපත් කළ දිනය සහ ඉරිදා දිනයන් හා ප්‍රසිද්ධ නිවාඩු දිනයන් ඇතුළත් නොවේ.) | |

| | | |
|---|---|---|
| 63 | මහෝපාධ්‍යායයන් වහන්සේ විසින් විනය මණ්ඩලයේ නිර්දේශ මත ලබාදෙන ලද දඬුවම් සමාලෝචනය කිරීම සඳහා ඔහු විසින් පත්කරන ලද අභියාචනා මණ්ඩලයක් වෙත එකී අභියාචනය යොමු කළ යුතුවේ. | |
| 64 | මහෝපාධ්‍යායයන් වහන්සේ විසින් පත්කරනු ලැබූ අභියාචනා කමිටුව පරිණත පුද්ගලයින් තිදෙනෙකුගෙන් සමන්විත විය යුතු ය. | |
| 65 | අභියාචනා මණ්ඩලය ඒ වන විටත් ලැබී ඇති විධිමත් විමර්ශනයේ තොරතුරු යොදා ගනිමින් අභියාචනය සම්බන්ධයෙන් තීරණයක් ගනු ඇත. නියම කරනු ලද දඬුවම සම්බන්ධයෙන් විනය මණ්ඩලයේ තීරණය සමාලෝචනය කිරීම සඳහා අභියාචනා මණ්ඩලයට බලය ඇති අතර, දඬුවම සම්බන්ධයෙන් වූ තීරණය සනාථ කිරීම, වෙනස් කිරීම හෝ ඉවත් කිරීම කළ හැකිය. | |
| 66 | වරක් මහෝපාධ්‍යායයන් වහන්සේ විසින් නිවේදනය කරන ලද අභියාචනා මණ්ඩලයේ තීරණය අවසන් තීරණය විය යුතුය. | |
| **5 වන කොටස** | | |
| **අර්ථ නිරූපණය** | | |
| 67 | මෙම අතුරු ව්‍යවස්ථාව අවබෝධ කරගැනීමේ අපහසුතාවක් හා/හෝ විෂමතාවක් පවතින්නේ නම්, හා/හෝ අසංගතතාවක් පවතින්නේ නම්, ඒ පිළිබඳව මහෝපාධ්‍යායයන් වහන්සේගේ අර්ථ නිරූපණය අවසාන හා තීරණාත්මක විය යුතුය. | |
| | 1 | ලියාපදිංචි ශිෂ්‍යයෙක් - ඕනෑම අධ්‍යයන වර්ෂයක් සඳහා විශ්වවිද්‍යාලයට නිසි පරිදි ඇතුළත් කර ලියාපංදිචි කර ඇති ඕනෑම ශිෂ්‍යයෙකු. |
| | 2 | අධ්‍යයන වර්ෂය - සනාතන සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන අධ්‍යයන වර්ෂය අදහස් කරනු ලැබේ. |
| | 3 | වෙනත් ඕනෑම නීතිමය ලියවිල්ලක් - විශ්වවිද්‍යාලයට අදාළ ඕනෑම නියෝගයක් නියමාවලියක්, ආඥාවක්, අතුරු ව්‍යවස්ථාවක්, ප්‍රතිපත්ති, චක්‍රලේඛ හෝ රීතියක් අදහස් කෙරේ. |
| | 4 | විශ්වවිද්‍යාල දේපළ - විශ්වවිද්‍යාලයේ සියලු ම චංචල නිශ්චල ප්‍රත්‍යක්ෂ සහ ප්‍රත්‍යක්ෂ නොවන විශ්වවිද්‍යාලයේ වත්කම් අදහස් කෙරේ. |
| | 5 | නියමිත අධිකාරිය - මහෝපාධ්‍යායයන් වහන්සේ/විනය පාලක/පීඨාධිපති/ශාලාධිපති අදහස් කෙරේ. |